ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ
නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2017

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය* :-

2017 නොවැම්බර් මාසයේදී විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පවත්වනු ලබන යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත මෙම තනතුර සඳහා අයදුම්කරුවෙකු බඳවා ගනු ලැබේ.

03. *සේවා කොන්දේසි* :-

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද, යටත්ව විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

(i) පත් කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. *සටහන.*- විශ්‍රාමික වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

(iii) විවෘත බඳවා ගැනීම් යටතේ පත් කරනු ලබන නිලධාරීන් වසර 3 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් තනතුරට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසිවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසි වලටද, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටද, යටත් වේ.

04. *වැටුප්* :

I. වැටුප් කේත අංකය :-
SL - 1 - 2016

II. වැටුප් පරිමාණය :-
රු.47,615-10 x 1,335-8 x 1,630-17 x 2,170-1,10,895

ශ්‍රේණි ක්‍රමයට ආරම්භක වැටුප් පියවර

ශ්‍රේණිය	*ආරම්භක වැටුප් පියවර*	*ආරම්භක වැටුප් තලය*
I	පියවර 01	රු. 47,615/=
II	පියවර 12	රු. 62,595/=
III	පියවර 20	රු. 76,175/=

(වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදිය.)

05. *වයස් සීමාව* :-

අවම සීමාව : වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :-

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ/ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

පළපුරුද්ද :-

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයකින් / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :

I. යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර එහිදී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

II. යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය

			උපරිම ලකුණු
01	**අතිරේක අධ්‍යාපන සුදුසුකම්**		20
	පශ්චාත් උපාධිය	20	
	පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව	15	
උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ. (නීති උපාධිය හෝ නීති විද්‍යාල අවසන් වසර සුදුසුකම් සඳහා ලකුණු ලබා නොදේ.)			
02	**අතිරේක වෘත්තීය සුදුසුකම්**		15
	නීති ක්ෂේත්‍රයට අදාළ වෙනත් වෘත්තීන්හි නිරත වීම. (වසර 3 ට වැඩි)	15	
	නීති ක්ෂේත්‍රයට අදාළ වෙනත් වෘත්තීන්හි නිරත වීම. (වසර 2-3)	10	
	නීති ක්ෂේත්‍රයට අදාළ වෙනත් වෘත්තීන්හි නිරත වීම. (වසර 2ට අඩු)	05	
03	**අතිරේක පළපුරුද්ද**		30
	නීතිඥවරයකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද එක් වසරකට ලකුණු 5 බැගින් උපරිම ලකුණු 30ක් (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 3 ක සේවා කාලය හැර)	30	
(පළපුරුද්ද සනාථ කරන ලේඛන ඉදිරිපත් කළ යුතුය)			

			උපරිම ලකුණු
04	**ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**		15
	රජයේ පිළිගත් ආයතනයක වසර 01 ක් හෝ ඊට වැඩි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	15	
	රජයේ පිළිගත් ආයතනයක වසර 01 ට අඩු මාස 06 ට වැඩි ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	10	
	රජයේ පිළිගත් ආයතනයක මාස 06ට නොඅඩු ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා	05	
05	තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම		15
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා	15	
	රජයේ පිළිගත් ආයතනයක වසර 01 ට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	10	
	රජයේ පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	05	
	රජයේ පිළිගත් ආයතනයක මාස 03 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා	03	
06	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව		05
	මුළු ලකුණු		100

08. *අයදුම්පත් කැඳවීමේ ක්‍රමය* :

රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමග ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2" X 12" (A 4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම් පත්‍රය 2017 ඔක්තෝබර් 31 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස

ඉහළ කෙලවරේ "නීති නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම"යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන :-

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

09. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතික වල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද තහවුරු කිරීමේ සහතික.

සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම තනතුරට පත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් තනතුරට පත් කිරීමට පෙර හෝ තනතුරට පත් වූ පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කල බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* 03 වන ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ආර්.එම්. ආරියදාස,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2017 සැප්තැම්බර් මස 26 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ
නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය	

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 1
දෙමළ - 2 (අදාළ කොටුව තුළ ලියන්න)

01. නම :-

1.1 මුලකුරු අගට යොදු මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
:————. (උදා :) SILVA B.A.

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(පැරණි ජාතික හැඳුනුම්පත් අංක සටහන් කිරීමේදී අග කොටු 02 හිස්ව තබන්න)

02. 2.1 ලිපිනය :-

(*අ*) පෞද්ගලික ලිපිනය :————.

(*ආ*) රාජකාරී ලිපිනය :————.

2.2 දුරකථන අංකය :————.

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල කොටුව තුල සළකුණු කරන්න)

ස්ත්‍රී	
පුරුෂ	

3.1 උපන් දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.2 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :-

අවුරුදු | | මාස | | | දින | |

3.3 විවාහක අවිවාහක බව (අදාල අංකය කොටුව තුල සළකුණු කරන්න)

විවාහක	
අවිවාහක	

04. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

4.1 නීතිය පිළිබඳ උපාධිය ලබාගත් ආයතනය :————.

4.2 නීතිය පිළිබඳ උපාධිය ලබාගත් වර්ෂය :————.

4.3 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබේද යන වග :————.

4.4 දිවුරුම් දී තිබේ නම් ඒ කෙදිනක සිටද යන්න :————.

05. පළපුරුද්ද :-

5.1 වසර 03 ක සක්‍රීය වෘත්තීය පළපුරුද්ද ලබා ඇති ආයතනය :-
(තහවුරු කිරීම සඳහා සහතිකවල පිටපත් අමුණන්න)

06. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

තනතුර	ආයතනය	සිට	දක්වා

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම දෙපාර්තමේන්තුවේ ..... ලෙස සේවය කරන ..... මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.